# දිළිඳු බවින් අත්මිදී ආධ්‍යාත්මික දියුණුව ලැබීමට බෞද්ධ ඉගැන්වීම්වලින් ලද හැකි පිටිවහල

දිළිඳු බව ලෝකය පුරා දක්නට ලැබෙන්නකි. බුදුදහම එය අනුමත නොකරන අතර එය පිටුදැකිය යුතු බව දේශනා කරයි. ජන සමාජය දුර්වල වීම, අස්ථාවර වීම, සදාචාරාත්මක වශයෙන් දුර්වල වීම ආදී සමාජ ව්‍යසනයන් ජනිත වීමට රටෙහි පවත්නා දේශපාලන තත්වය හේතුවන බව බුදුසමය පිළිගනී. කවර සමාජයක වුව ද ජීවත් වන මිනිසුන්ගේ භෞතික අවශ්‍යතා අසම්පූර්ණ වූ විට, ආධ්‍යාත්මික දියුණුවක් කරා යා නොහැක. රටෙහි දේශපාලන නායකත්වය තම පුර වැසියන්ගේ මූලික අවශ්‍යතා සාධාරණ ලෙස හා ප්‍රමාණවත් ලෙස සැපයීමෙහි ලා අපොහොසත් වූ විට පුද්ගල හා සමාජ ගැටළු නිර්මාණය වේ. දිනපතා කුසට අහරක් නොමැතිව, රාත්‍රී නින්දට යන ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් ලෝකයේ සිටිති. ජීවත්වීමේ අවම අවශ්‍යතා ලෙස ආහාර සහ ඇඳුම්වත් නැතිව ජීවත් වන මේ ජනතාවගේ සිත් නිරන්තරයෙන් අධික ලෙස පීඩාවට පත්වන අතර ඔවුන්ගේ ජීවිත දිළිඳු බවෙහි පතුලට වැටී ඇත. කුසගින්න හා දිළිඳුකම අතිනත ගත් සමාජයක ජීවත් වන පුද්ගලයන්ගේ ජීවිත මෙන් ම ඔවුන් ජීවත් වන ජන සමාජය ද නිරන්තරයෙන් අතෘප්තියෙන් අසහනයෙන් හා අසතුටෙන් පිරී පවතී. මේ නිසා කරව සමාජයක වුව ද එහි සමාජ සංවිධානය හා සමාජ ව්‍යුහය දෙදරවා දැමීමට කුසගින්න හා දිළිඳු බව සමත් වී සිටි. කුසගින්නෙන් සිටි මගියෙකුට ධර්මය දේශනා කිරීම පවා නිෂ්ඵල බව වටහා ගත් බුදුන් වහන්සේ ප්‍රථයෙන් ඔහුට ආහාර සපයා දෙවනුව ධර්මය දේශනා කරන්නට අවස්ථාව ෂලස්වා දුන් බව කියවේ. එයින් පෙනී යන්නේ ද යහපත් ආර්ථිකයක් තුළ ආධ්‍යාත්මික වර්ධනයක් සිදුකළ හැකි බවය. කුසගින්නේ සිටින්නෙකුට කිසිවක් නොවැටහෙන බව බ්‍රාහ්මණ ඉගැන්වීම්වල ද දක්නට ලැබේ. (බුභුක්ෂිතං න ප්‍රතිභාති කිඤ්චිත්)[1]

සමාජයක සදාචාර පරිහානියට දිළිඳු බව මුල්වන බව මෙන් ම කාමභෝගී ජීවිත ගතකරන ගිහියන්ට එය දුකක් ද වන බව බුද්ධ දේශනාවෙන් පෙනීයයි.

**දාළිද්දියං භික්ඛවෙ දුක්ඛං ලොකස්මිං කාමභොගිනොති? එවං භන්තෙ** (මහණෙනි, ලෝකයෙහි කාමභොගීන්හට දිළිඳු බව දුක් වේද? වහන්ස, එසේය )

**යම්පි භික්ඛවෙ දළිද්දො අස්සකො අනාළ්හියො ඉණං ආදියති. ඉණාදානම්පි භික්ඛවෙ දුක්ඛං ලොකස්මිං කාමභොගිනොති? එවං භන්තෙ** (මහණෙනි යම් හෙයකින් තමන් අයත් ධනයක් නැති දිළින්දෙක් ණය ගන්නේ නම් ලෝකයෙහි ඒ කාමභෝගීහට ණය ගැණුම ද දුකක් වේද? වහන්ස, එසේය)

**යම්පි භික්ඛවෙ දළිද්දො අස්සකො අනාළ්හියො ඉණං ආදියිත්වා වඩ්ඪිං පටිසුණාති, වඩ්ඪීපි භික්ඛවෙ දුක්ඛා ලොකස්මිං කාමභොගිනොති? එවං භන්තෙ** (මහණෙනි යම් හෙයකින් ධනය නැති දිළින්දෙක් පොලියට ණය ගෙන පොලී ගෙවන්නේ නම් ඒ කාමබෝගියාහට පොලිය ගෙවීම දුක් වන්නේ ද? වහන්ස, එසේය)

**යම්පි භික්ඛවෙ දළිද්දො අස්සකො අනාළ්හියො වඩ්ඪිං පටිසුණිත්වා කාලාභතං වඩ්ඪිං න දෙති. චොදෙන්තිපි නං චොදනාපි භික්ඛවෙ දුක්ඛා ලොකස්මිං කාමභොගිනොති? එවං භන්තෙ** (මහණෙනි යම් හෙයකින් ධනය නැති දිළින්දෙක් පොලියට ණය ගෙන නිසි කල්හි පොලිය නොදේනම් ඔහුට චොදනා ද කෙරෙත්. මහණෙනි ලෝකයෙහි ඒ කාමභෝගියාහට චෝදනාවත් දුකක් වේද? වහන්ස, එසේය.)

**යම්පි භික්ඛවෙ දළිද්දො අස්සකො අනාළ්හියො චොදියමානො න දෙති. අනුචරන්තිපි නං අනුචරියාපි භික්ඛවෙ දුක්ඛා ලොකස්මිං කාමභොගිනොති? එවං භන්තෙ** (මහණෙනි යම්හෙයකින් ධනය නැති දිළින්දෙක් චෝදනා කරනු ලැබුවත් නොදෙයි ද ඔහු පිරිස් මැද නිගා පැමිණේ ද එවැනි කාමභෝගීහට ලුහු බැඳීම දුකක් වන්නේ ද? වහන්ස, එසේය)

**යම්පි භික්ඛවේ දළිද්දො අස්සකො අනාළ්හියො අනුචරියමානො න දෙති. බන්ධනම්පි නං. බන්ධනම්පි භික්ඛවෙ දුක්ඛං ලොකස්මිං කාමභෝගිනොති? එවං භන්තෙ.**[2] (මහණෙනි යම් හෙයකින් ධනය නැති දිළින්දෙක් ලුහුබඳින්නේ නමුත් නො දෙයි. ඔහු සොර ගෙයි බඳින්නේය. මහණෙනි, ලෝකයෙහි කාමභෝගීහට බන්ධනය දුකක් වේද? වහන්ස, එසේය.

මෙම දේශනාව තුළින් පැහැදිලි වන්නේ දිළිඳුකමත් දිළිදුකම නිසා ණය ගැනුමත්, ණය ගෙන නොදීමත් නිසා සිදුවන නොයෙක් ගැහැට කාමභෝගී පුද්ගලයාට නිරන්තරයෙන් දුකක් වන බවය.

දිළිඳුකම යනුවෙන් දැක්වෙන්නේ යම් පුද්ගලයෙකුට ඉතාම අඩුවෙන් සම්පත් තිබීම හෝ සම්පත් නැතිකමය. සම්පත් නැතිකම නිසා ඔහුට නිරන්තරයෙන් අනුන්ට ණයගැති වීමට සිදුවෙයි. එසේත් නැතිනම් ගිවිසුම්වලට යටත් ව පොලී සහිත ව හෝ රහිතව හෝ වාරික වශයෙන් ගෙවීමට මුදල් ණයට ගැනීමට සිදුවෙයි. මෙය පුද්ගල ස්වාධීනත්වයට හා ඔහුගේ සමාජගත ජීවිතයට ද හානිදායක වෙයි. බන්ධනවලට ගොදුරු වෙයි. **(ඉධ භික්ඛවෙ එකච්චො දාළිද්දො හොති අප්පස්සකෝ අප්පභෝගෝ. එවරූපො භික්ඛවේ අද්ධකහාණෙපි බන්ධනං නිගච්ඡති. කහාපණෙනපි බන්ධනං ගච්ඡති. කහාපණ සතේනපි බන්ධනං නිගච්ඡති)**[3]

එසේම ධනය රැස්කර ගොඩගසා ගැනීම යහපත් නොවන බවත්, ධනය මිනිසාගේ ජීවිතයේ වැදගත් පුරුෂාර්ථයක් නොවන බවත් මෙහි ලා අවධාරණය කළ යුතුය. ධනය ජීවත් වීම සඳහා අත්‍යවශ්‍ය වූවකි. භවභෝග සම්පත් පිළිබඳ ව පමණක් සිතන්නා බුදුසමය දකින්නේ එක් ඇසක් ඇත්තෙකු ලෙසිනි. (එකචක්ඛු) ඔහු ධනය පිළිබඳ ව මිස ආධ්‍යාත්මික දියුණුවක් කෙරෙහි සිත යොමු නොකරයි. බුදුසමය අගය කරන්නේ දෑස් ඇත්තාය. ඔහු භවභෝග සම්පත් දැහැමින් සපයා ගනිමින් ආධ්‍යාත්මික වශයෙන් ද දියුණු වෙයි. **''කතමෝ ච භික්ඛවෙ පුග්ගලො ද්විචක්ඛු? ඉධ භික්ඛවේ එකච්චස්ස පුග්ගලස්ස තථාරූපං චක්ඛු හොති, යථාරූපෙන චක්ඛුනා අනධිගතං වා භොගං අධිගච්ඡෙය්‍ය, අධිගතං වා භොගං ඵාතිකරෙය්‍ය, තථාරූපම්පිස්ස චක්ඛු හොති, යථාරූපෙන චක්ඛුනා කුසලාකුසලෙ ධම්මේ ජානෙය්‍ය, සාවජ්ජානවජ්ජේ ධම්මේ ජානෙය්‍ය, හීනප්පණීතෙ ධම්මේ ජානෙය්‍ය, කණ්හසුක්කසප්පටිභාගෙ ධම්මේ ජානෙය්‍ය, අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො ද්විචක්ඛු''**[4]

(මහණෙනි දැස් ඇති පුද්ගලයා කවරේද යත්? මහණෙනි මේ ලෝකයෙහි කිසි පුද්ගලයෙකුහට යම් බඳු නුවණැසකින් නොලැබූ හෝ භෝගයන් ලබා ගන්නේ නම් ලබාගත් හෝ භෝගයන් වඩා ගන්නේ නම් එබඳු නුවණැසෙක් වෙයි. යම් බඳු වූ නුවණැසෙකින් කුසල් අකුසල් දහම් දැනගන්නේ නම් සදොස් නිදොස් දහම් දැනගන්නේ නම් හීන ප්‍රණීත ධර්මයන් දැනගන්නේ නම් අන්‍යොන්‍ය ප්‍රතිවිරුද්ධ වූ කෘෂ්ණ ශුක්ල ධර්මයන් දැනගන්නේ නම් එබඳු වූ නුවණැස ද ඔහුට වේ. මේ දැස් ඇති පුද්ගලයාය.)

ධනය ගොඩගසා ගැනීමෙන් පමණක් ම ප්‍රීතිය ලඟා කරගත නොහැකිය. ධනය සැප ලබා ගැනීම පිණිස විසර්ජනය කිරීම පිණිස ලබා ගන්නකි. ධනය ඇත්තා තමා කා බී ප්‍රීතිමත් වෙනවා මෙන් ම තම දෙමාපියන් අඹු දරුවන් ඤාති මිත්‍රයින් සේවක සේවිකාවන් ද පිනවීම සඳහා යොදා ගත යුතු බව බුදුදහම පෙන්වා දෙයි. (**අත්තානං සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති. මාතාපිතරො සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති. පුත්තදාරදාසකම්මකාරපොරිසෙ සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති)**[5] ධනය රැස් කර එහි ඇලී ගැලී තමාත් අනුනුත් සාමූහික ව සැපවත් වීම ධනෝපායනයෙහි අරමුණ විය යුතුය. ධනය මිනිසාගේ සේවකයෙකි. උපකරණයකි. ධනයට ගැතිව, ඊට දාසව, ධනකාමීව තමාට මෙන් ම සමාජයට ද අහිතකර, අනර්ථකාරී ලෙස ජීවත් වීම බුදුසමය අනුමත නොකරයි. **(භොගේ අනථිතො අමුච්ඡිතො අනජ්ඣොපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති'')**[6]

මෙහිලා අවධාරණය කලයුතු කරුණක් නම් ධනය රැස් කිරීම හුදු ධාර්මික ක්‍රමවලින් පමණක් කළයුතු බව බුදුසමය නිර්දේශ කරන බවයි. සමාජයෙහි පවතින දිළිඳුකම නැති කිරීම සඳහා මුදල් පරිත්‍යාග කිරීම ද ඊට පිළිතුරක් නොවන බව බුදුදහම කියයි. සක්විති පරපුරක බලය පිරිහෙන කරුණක් ලෙස දිළිඳු බව පෙන්වා දිය හැකිය. චක්‍රවර්ති රජුගේ චක්‍රය ඉවත් වීමට එක් හේතුවක් වන්නේ රාජ්‍ය තුළ දිළිඳු බව ඇතිවන විටය. මෙහි චක්‍රය යනු රාජ්‍ය බලය හා දේශපාලන ස්ථාවරත්වයයි. දිළිඳුකම නිසා සොරකම් කිරීම සිදුවෙයි. සොරකම් කළ පුද්ගලයාට රජු කරුණු විමසා ධනය දෙයි. (**අධනානං ධනෙ අනනුප්පදීයමානෙ දාළිද්දියං වෙපුල්ලමගමාසි. දාළිද්දියෙ වෙපුල්ලං ගතෙ අඤ්ඤතරො පුරිසො පරෙසං අදින්නං ථෙය්‍යසංඛාතං ආදියි..........අථ ඛො භික්ඛවෙ රාජා ඛත්තියො මුද්ධාභිසිත්තො තස්ස පුරිසස්ස ධනමනුප්පාදාසි......)**[7] එය වැරදි ලෙස වටහාගත් ජනයා ද සොරකම් කරන්නේ රජුගෙන් ධනය ලබා ගැනීමටය. මෙයින් සොරකම වැඩි වී වෙනත් සමාජ ප්‍රශ්න ඇතිවෙයි. **(ඉති ඛො භික්ඛවෙ අධනානං ධනෙ අනනුප්පදීයමානෙ දාළිද්දියං වෙපුල්ලමගමාසි. දාළිද්දියෙ වෙපුල්ලං ගතෙ අදින්නාදානං වෙපුල්ලමගමාසි. අදින්නාදානෙ වෙපුල්ලං ගතෙ සත්ථං වෙපුල්ලමගමාසි. සත්ථෙ වෙපුල්ලං ගතෙ පාණාතිපාතො වෙපුල්ලමගමාසි...........)**[8]

වත්මන් ලෝකයේ වුව ද සුබසාධන ආදි වශයෙන් දිළිඳු ජනතාවට විවිධ වූ පහසුකම් සපයයි. ශ්‍රී ලංකාවේ ද එබඳු සුබසාධන කටයුතු යටතේ ජනසවිය, සමෘද්ධි ආදි මූල්‍යමය පහසුකම් දිළිඳු ජනතාවට සපයයි. එහෙත් ඔවුන්ගේ දිළිඳු බව තුරන් වී නැත. දිළිඳුකම තුරන් කිරීමේ දී රට වැසියා රටෙහි ජාතික නිෂ්පාදන කාර්යයට යොමු කොට ඔහුගේ ආර්ථික තත්වය නගා සිටුවීමෙහිලා විධිමත් ක්‍රමයක් බුදුදහම පෙන්වා දෙයි. කෘෂිකර්මාන්තයෙහි ද, වාණිජ කටයුතුවල ද, සත්ත්ව පාලනයෙහි ද, රාජ්‍ය අංශයෙහි ද යෙදෙන්නවුන් සඳහා ආධාර සපයා ඔවුන්ගේ ව්‍යාපාරයන් හි ආයෝජනය කිරීමට රාජ්‍ය බලය යෙදවිය යුතුය. එසේ නියමාකාරයෙන් රාජ්‍ය බලය පතුරුවන විට රටවැස්සෝ තමන්ගේ වැඩපලෙහි නියුක්ත ව

රජුගේ රට නොපෙලන්නේය. රජුගේ ධනධාන්‍ය රැස ද මහත් වන්නේය. ජනපදයේ සොර ආදීන්ගෙන් වන්නා වූ උවදුරු නැතිව. නිරුපද්‍රිත ව සිටින්නාහ. මිනිස්සු ද උනුන් කෙරෙහි සතුටු වන්නාහු උරෙහි දරුවන් නටවමින් අගුලු නො දැමූ දොරවල් සහිත ව බියක් සැකක් නැතිව වාසය කරන්නාහ. **(තෙන හි භවං රාජා යෙ භොතො රඤ්ඤො ජනපදෙ උස්සහන්ති කසිගොරක්ඛෙ, තෙසං භවං රාජා බීජභත්තං අනුප්පදෙතු. යෙ භොතො රඤ්ඤො ජනපදෙ උස්සහන්ති වණිජ්ජාය. තෙසං භවං රාජා පාභතං අනුප්පදෙතු. යෙ භොතො රඤ්ඤො ජනපදෙ උස්සහන්ති රාජපොරිසෙ. තෙසං භවං රාජා භත්තවෙතනං පකප්පතු. තෙ ච මනුස්සා සකම්මපසුතා රඤ්ඤෝ ජනපදං න විහෙඨෙස්සනිති. මහා ච රඤ්ඤෝ රාසිකො භවිස්සති. ඛෙමට්ඨිතා ජනපදා අකණ්ටකා අනුප්පීළා. මනුස්සා ච මුදා මොදමානා උරෙ පුත්තේ නච්චන්තො අපාරුතඝරා මඤ්ඤේ විහරිස්සන්ති)**[9]

රටෙහි සොරකම් ආදි සමාජ ව්‍යසනයන් වර්ධනය වූ විට **"අහමෙතං දස්සුඛීලං වධෙන වා බන්ධෙන වා ජානියා වා ගරහාය වා පබ්බාජනාය වා සමූහනිස්සාමීති"** යනාකාරයට වධ කිරීමෙන් හෝ බැඳලීමෙන් හෝ දඩ ගැසීමෙන් හෝ හිස මුඩු කරවීම් ආදි ගැරහුමෙන් හෝ රටින් නෙරපීමෙන් හෝ මේ සොර හුල මුලින් ම උදුරාලන්නෙමි'යි සිතා රාජ්‍ය බලය යොදා මර්දනය කරන්නට යාම බුදුසමය මෙහිදී අනුමත නොකරයි. රාජ්‍ය මර්දනය තාවකාලික විසඳුමක් වෙයි. යම් සමාජයක පාලන තන්ත්‍රය විසින් ද ක්‍රියාත්මක වන ආර්ථික සැලසුම් මගින් එම සමාජයේ ධනය අහිමි වන පිරිස් වැඩිවිය හැකිය. එය ද එම සමාජයේ පිරිහීමට හේතු විය හැකිය. එමනිසා රාජ්‍යයක ආර්ථිකය සැලසුම් සහගත ව ක්‍රියාත්මක කළ යුතුය. වැසියා ආර්ථික වශයෙන් දියුණු කිරීමෙන් පසුව ආධ්‍යාත්මික ව සදාචාර සම්පන්න වර්ධනයක් සිදු කළහැකි බව බුදුසමය නිර්දේශ කරයි.

දිළිඳුකම නැතිවන්නේ මිනිසා ධනවත් වූ විටය. ධනවත්වීම බුදුසමය ප්‍රතික්ෂේප නොකරන අතර ඒ සඳහා වූ යහපත් මාර්ගය බුදුසමයෙන් පෙන්වා දෙයි. පුද්ගලයාගේ ආර්ථික තත්වය පිරිහීමට හේතු වන සුරා, සූදු, වෛශ්‍ය ඇසුර ආදි දුරාචාර සමාජයේ ඇත. තමන්ගේ දහඩිය මහන්සියෙන් උපයන ධනය විනාශ කරන පුද්ගලයා පරිහානියට පත් වෙයි. එවැනි දුරාචාරවලට යොමුව ආර්ථික පරිහානියට පත්වෙන පුද්ගලයා තම ගෘහ හා සමාජ ක්‍රියාවලිය ගෙනයාමට නොහැකි තත්වයට පත් වේ. එබඳු පුද්ගලයා සමාජ දූෂණයට හේතු වන ක්‍රියාවල නිරත වෙයි. පෞද්ගලික වශයෙන් පවුල් සංස්ථාව තුළ ගැටළු ඇති කරයි. මේ තත්වය සමාජ ධාර්මිකත්වයට බාධාවකි.

සිගාලෝවාද සූත්‍රය සමාජ සම්බන්ධතාවන් මගින් ආර්ථික වශයෙන් දියුණුවීමට අවශ්‍ය කරන ධාර්මික සැකැස්ම පිළිබඳ විස්තර කරන සූත්‍රයක් ලෙස පෙන්වා දිය හැකිය. සමාජගත පුද්ගලයෙකු සංවිධිත සමාජයකට යොමු කොට ධාර්මික සැකැස්මකට යොමු කිරීමක් එහි දක්නට ලැබේ. සමාජගත පුද්ගලයන් ගෘහ ජීවිතය පදනම් කරගෙන ධාර්මිකත්වය වෙත යොමු කරවන ආචාර ධර්මයක් වන එහි අනුපිළිවෙලින් ඇති කරුණු අතර පළමු ව චතුර්විධ කර්මක්ලේශ (ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය, මුසාවාදය) ෂට්විධ භෝග විනාශ මුඛ (මත්පැන් පානය, නුසුදුසු කාලයෙහි වීථි සංචාරය, නැටුම් පොලවල නිතර හැසිරීම ද, දූ කෙළිය, පාප මිත්‍රයන් සේවනය කිරීම, අලසකම)[10]

යනුවෙන් දැක්වෙන පාප ධර්මයන් කෙරෙන් වැලකෙන පුද්ගලයා යහපත් බවට පත්වන බව පෙන්වා දී ඇත. ඔවුන් දිළිඳු තත්වයට පත්වීම සිදු නොවන බවද පෙන්වා දෙයි.

ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ද සමාජ සම්බන්ධතා පවත්වා ගැනීමට පුද්ගලයාගේ ආර්ථික තත්වය දියුණු විය යුතු බව පෙන්වා දෙයි. පුද්ගලයාගේ ආර්ථික ශක්තිය හා ආර්ථික සුරක්ෂිතතාව ද, ධන සම්පත් පිළිබඳ නිරවද්‍ය පරිහරණය ද එහි අත්‍යවශ්‍ය මූලිකාංග වෙයි. පුද්ගලයාගේ ලෞකික අභිවෘද්ධියට හේතු වන කරුණු 4 ක් මේ සූත්‍රයෙහි දැක්වෙයි. **''චත්තාරො මෙ ව්‍යග්ඝපජ්ජ, ධම්මා කුලපුත්තස්ස දිට්ඨධම්මහිතාය සංවත්තති දිට්ඨධම්මහිතාය දිට්ඨධම්මසුඛාය. කතමෙ චත්තාරො? උට්ඨානසම්පදා, ආරක්ඛසම්පදා, කල්‍යාණමිත්තතා, සමජීවිකතා. කතමා ච භික්ඛවෙ උට්ඨාන සම්පදා? ඉධ ව්‍යග්ඝපජ්ජ කුලපුත්තෝ යෙන කම්මට්ඨානෙන ජීවිකං කප්පෙති. යදි කසියා. යදි වණිජ්ජාය. යදි ගො රක්ඛෙන. යදි ඉස්සත්ථෙන. යදි රාජ පෝරිසෙන. යදි සිප්පඤ්ඤතරෙන. තත්ථ දක්ඛො හෝති අනලසො තත්‍රූපායාය වීමංසාය සමන්නාගතො. අලං කාතුං අලං සංවිධාතුං අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ උට්ඨානසම්පදා''**[11]

බුදු දහමින් පුද්ගලයාගේ ජීවනෝපාය සඳහා කෘෂිකර්මය. වෙළදාම, ගව පාලනය, ධනු ශිල්පය හා රාජ්‍ය සේවය වැනි වෘත්තීන් නිර්දේශ කරයි. මෙහි දී ගව පාලනය මස් පිණිස නොව කෘෂි කර්මාන්තය හා කිරි දොවා ගැනීම සඳහා පමණක් බව සැලකිය යුතුය. වාණිජ කටයුතු සඳහා ද තලාකූට, මානකූට, කංසකූට වැනි බාධකයන් තුළින් වංචා නොකිරීම දක්වයි.

උට්ඨාන සම්පදාව යනු ස්වකීය කුසලතා අනුව ජීවනෝපාය සඳහා ධර්මික වෘත්තියක් තෝරා ගැනීම හා එම වෘත්තියෙහි උත්සහයෙන් හා සංවිභාගශීලීව ක්‍රියා කලයුතු ආකාරය ඉන් පැහැදිලි කරයි. එසේ උපයාගත් ධනය අපාය මුඛවලින් වැළකී ආරක්‍ෂා කරගතයුතු බව දෙවැනි ව දැක්වෙන ආරක්ඛසම්පදාවෙන් පැහැදිලි කරයි. උපයාගත් ධනය අවශ්‍යතාවන් හා අවදානම් සලකමින් අය වැය සමව දැන වියදම් කළයුතු බව සිව්වන කරුණෙන් පැහැදිලි කෙරෙයි. ධාර්මික ව ධනය ඉපයීමේ දී ඒ පිළිබඳ ගුණාත්මක අගයන් බුදුසමය පෙන්වා දෙයි. **''උට්ඨානවිරියාධිගතෙහි භෝගෙහි බාහාබලපරිචිත්තෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි ධම්මලද්ධෙහි''**[12] ඒ අනුව දැඩි උත්සහයෙන් බාහු දෙකෙහි බලයෙන් දහඩිය වැගුරුණු ශරීරයෙන් ධාර්මික ව හා ධාර්මික ව ලබාගත් දෙයක් වියයුතුය.

වත්මන් සමාජය තුළ ධනය ඉපැයීමෙහි උපාය මාර්ග පිළිබඳ ව නොතකන අතර කෙසේ හෝ ධනය උපයා ගැනීමට වෙර දරයි. විවිධ සමාජ ව්‍යසනවලට හා පාරිසරික ගැටලුවලට සමස්ත ලෝකය ම මුහුණ පා ඇති මේ ගැටළුවට හේතුව මිනිසාගේ අතෘප්තිකර ධන ආශාව හා තමා පමණක් ජීවත් විය යුතුය යන පටු කල්පනාව නිසාය. එහෙත් බුදුදහම කිසිදු හිංසාකාරී ක්‍රමයකින් ධනෝපායනය නිර්දේශ නොකරයි. (ධම්මේන භොගෙ එරියෙසති අසාහසෙන)[13]

මෙහි දී භෝග රැස්කිරීම හෙවත් නිෂ්පාදනය (ධම්මේන භොගෙ පරියෙසති) පරිභොජනය (අත්තානං සුඛෙති පීණෙති) බෙදාහැරීම (සංවිභජති පුඤ්ඤානි කරොති) පරිභොජනය (අගථිතො, අමුඡිතො, අනජ්ඣාපන්නො, ආදීනව දස්සාවි, නිස්සරණපඤ්ඤෝ පරිභුඤ්ජති) යන කරුණු සම්බන්ධයෙන් බුදුසමය වඩාත් සැලකිලිමත් වන බව පෙන්වයි.[14] එසේම බුදුසමය පෙන්වා දෙන්නේ

ධාර්මිකව උපයා සපයා ගන්නා ධනයෙන් තමන් පමණක් නොව තමාට සම්බන්ධ සෙසු පිරිස් ද පෝෂණය කළයුතු බවය. **"පුනචපරං ගහපති, අරියසාවකො උට්ඨානවිරියාධිගතෙහි භොගෙහි බාහාබලපරිච්තෙහි සෙදාවක්ඛිත්තෙහි ධම්මිකෙහි පඤ්ච බලී කත්තා හොති. ඤාතිබලිං, අත්ථිබලිං, පුබ්බපෙතබලිං, රාජබලිං, දෙවතාබලිං.**[15] මේ අනුව පෙනී යන්නේ තමන්ගේ ධනය මිනිසුන් කෙරෙහි පමණක් නොව ඉන් එහා ගිය දේවතා බලි ආදිය ද කළයුතු බවය.

භෞතිකවාදී චින්තනය තුළ දිළිඳු බව සම්බන්ධයෙන් දක්වන දෘෂ්ටි කෝණය වෙනස් වෙයි. ආධ්‍යාත්මික තත්වයන් එයට නැත. සම්පත් ජනතාව අතරේ බෙදී නොයාම නිසා දිළිඳුකම ඇතිවන බව ඉන් කියවේ. බෞද්ධ චින්තනය අනුව ආධ්‍යාත්මික දිළිඳු බවක් ද දැක්විය හැකිය. බෞද්ධ සම්ප්‍රදාය තුළ ධනය හා වස්තු ගැන කථා කරයි. එය ආර්ය ධනය ලෙස හැඳින්වෙයි. ආධ්‍යාත්මික ජීවිතය ගැන කථා කරන විට කෙනෙකු දිළින්දෙකු වන්නේ ද්‍රව්‍ය හා වස්තු ඌණතාවෙන් පමණක් නොවෙයි. ආර්ය ධනයෙන් පිරිහීම නිසාය. පැවිද්දෙකු දිළිඳු වන්නේ ආර්ථික වශයෙන් ගැනෙන භවභෝග ආදි සම්පත් ඌණතාවක් නිසා නොව සද්ධා, සීල, සුත, චාග, හිරි, ඔත්තප්ප, පඤ්ඤා යන ආධ්‍යාත්මයට සම්බන්ධ ගුණධර්ම ඌණතාව නිසාය. එසේම කිපෙනසුලු බව, වෛරය යනාදි දුර්ගුණයන් හා ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට ආහාර පැන් වස්ත්‍ර ආදි අවශ්‍යතා නොදීම නිසාද පසු ආත්මවලදී දිළිඳුව උපදින බව පෙන්වා දෙයි. **"ඉධ මල්ලිකෙ එකච්චො මාතුගාමො කොධනා හොති උපායාසබහුලා අප්පම්පි වුත්තා සමානා අභිසජ්ජති. කුප්පති. බ්‍යාපජ්ජති. පතිත්ථීයති, කෝපඤ්ච දොසඤ් ච අප්පච්චයඤ්ඤ පාතු කරොති සා න දාතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං. ඉස්සාමනිකා ඛො පන හොති. පරලාභසක්කාරගරුකාරමානනවන්දනපූජනාසු ඉස්සති උපදුස්සති ඉස්සං බන්ධති. සා චෙ තතො චුතා ඉත්ථත්තං ආගච්ඡති. සා යත්ථ යත්ථ පච්චාජායති දුබ්බණ්ණා ච හොති දුරූපා ච සුපාපිකා දස්සනාය. දළිද්දා ච හොති අප්පස්සකා අප්පභොගා අප්පේසක්ඛා ච"**[16]

ධනය කිසිසේත් මිනිසාට හානිකර බව බුදුසමය නොකියයි. එහෙත් මසුරු මලයෙන් යුත් පුද්ගලයාට ධනය හානිකර වෙයි. බමරෙකු මල නොතලා රොන් ගන්නා සේ සමාජයට හා පරිසරයට අහිතකර නොවන සේ හානිකර නොවන සේ සත්ථ (ආයුධ) සත්ත, (මිනිස්) විස, මංස (මස්) මජ්ජ (මත්පැන්) යන නොකටයුතු වෙළදාම් පසින් ද ඉවත් වී වේයකු තුඹසක් බඳින්නා සේ දැහැමින් සෙමින් උපයන ධනය බුදුසමය පිළිගනී. තෘෂ්ණාව ලෝභය අඩුකර ගැනීමට බුදුසමය උපදෙස් දෙන නිසා පුද්ගලයා තුළ වස්තු කාමය නැති වී යාම නිසා බෞද්ධ සමාජවල ආර්ථික දියුණුවක් නැති බවට සමහර ආර්ථික විශේෂඥයෝ තර්ක කරති. ඔවුන් විසින් එබදු ප්‍රකාශ කරනු ලබන්නේ ආර්ථික වටිනාකම් ඇතැයි සලකනු ලබන ඌරු, කුකුල්, එළු, මිරිදිය මත්ස්‍ය, කරදිය මත්ස්‍ය ආදි බෞද්ධ ආචාර ධර්ම විරෝධි ව්‍යාපාර සඳහා බුදුසමයෙන් ඉඩක් නොදීම නිසා ධනෝපායන මාර්ග බෞද්ධ සමාජයට අහිමි වී යන බවය. එහෙත් මෙම දිවයින පෙරදිග ධාන්‍යාගාරය ලෙස යශෝරාවයක් ලබා ගත්තේ එබඳු සත්ත්ව පාලන කටයුතුවලින් නොවන බව ආවධාරණය කළ යුතුය.

අනුරාධපුර පොළොන්නරු වැනි යුගවල දී එවක සිටි රජවරුන්ගේ දක්ෂ පරිපාලනය හා කළමණාකරනය යටතේ මෙරට පැවති ස්වයංපොෂිත තත්වය අන් කවරදාකවත් මෙරට තිබී නැත. එබඳු දියුණු ආර්ථික පරිසරයක් තුළ මෙරට පැවති ආධ්‍යාත්මික දියුණුව තුළින් පෙනීයන්නේ යම් සමාජයක ආධ්‍යාත්මික දියුණුවක් පැවතීමට නම් එහි වැසියාට යහපත් ආර්ථික පරිසරයක් ද තිබිය යුතු බවය. එහෙත් පසුකාලීනව විවිධ ආර්ථික දුෂ්කරතාවන්ට මෙරට වැසියාට මුහුණ දීමට සිදු වූ කාරණා කිහිපයක් නිසා ආර්ථික වශයෙන් මෙන් ම ආධ්‍යාත්මික වශයෙන් ද පරිහානි තත්වයක් උදා වූ බවය. මෙයින් ද පෙනී යන්නේ බුදුදහම සිරිලක උපරිම තලයෙහි පැවති ආවස්ථාවට සමගාමීව ආර්තික සමෘද්ධිය ද පැවති බවය. මෙයින් පෙනී යන්නේ බුදුසමය පුද්ගලයා හා ලෝකය දියුණු කිරීමට අවශ්‍ය කරන තෘෂ්ණාව නැතිකර දැමීම සඳහා අනුශාසනා කරන බවය.

මිනිසාට තිබියයුතු සැප පිළිබඳ ව සැලකීමේ දී අත්ථි සුඛය, භෝග සුඛය, අණන සුඛය, අනවජ්ජ සුඛය ආර්ථික වශයෙන් වැදගත් වන බවයි. මෙහි ලා සලකන විට බුදුසමය අනුව අනවජ්ජ සුඛය වැඩි වටිනාකමක් උසුලනු ලබයි. බොහෝ රටවල් මුහුණ පා ඇති ආර්ථික ගැටළුවලින් හා දිළිඳුබවින් මිදීම පිනිස කුමන හෝ ක්‍රමවේදයක් බුදුසමය නොපිළිගනී. වත්මන් ලෝකයෙහි ධනවතුන් වීමේ පහසු ක්‍රම ලෙස අවි ආයුධ හා මත්ද්‍රව්‍ය වෙළදාම පහසු ක්‍රමයක් වී ඇති' එහෙත් බුදුසමය හිංසාකාරී ක්‍රම තුළින් සොයන ධනය පිළිකුල් කරයි.

ආලවක යක්ෂයා විසින් **''කථංසු ලභතෙ පඤ්ඤං - කථංසු වින්දතෙ ධනං''**[17] ආදි වශයෙන් අසන ලද ප්‍රශ්නවලට බුදුරදුන් විසින් වදාළ **''පතිරූපකාරී ධුරවා - උට්ඨාතා වින්දතෙ ධනං''**[18] යන පිළිතුරෙන් ද පෙනී යන්නේ ලෞකික ලෝකෝත්තර ධන ලාභයට සුදුසු අන්දමින් ක්‍රියා කරන චෛතසික වීර්ය ඇති එසේම කායික වීර්ය ඇති තැනැත්තේ ධනය ලබයි යනුවෙනි. **''යොධ සීතඤ්ච උන්හං ච තිණා භීයො න මඤ්ඤති''**[19] යනුවෙන් යමෙක් සීතෝෂ්ණ දෙක තණපතක් තරමටවත් නොසලකා නොමැලි ව කෘෂි වණිග් ආදි කර්මාන්තයන්හි යෙදේ නම් ඒ තැනැත්තේ මළ එක මී කුණකින් නොබෝ කලකින් දෙලක්ෂයක් වස්තුව ලැබූ චුල්ලන්තේවාසිකයා මෙන් ලෞකික ධනය ද. නිදිමත හැදෙන කල තෙමූ පිදුරු වෙණියක් හිසමත තබාගෙන ගළවලු තරම් වතුරෙහි සිට භාවනා කොට දොළොස් අවුරුද්දකින් රහත් වූ මිලක්ඛතිස්ස තෙරුන් මෙන් ලෝකෝත්තර ධනය ද ලබන බවය.

මහධන සිටුපුත් අරහයා දේශනා කරන ලද ධර්මයෙන් පෙනී යන්නේ ද තරුණ වයසෙහි දී කළයුතු දෑ නොකොට මහලු වයසට පැමිණ දුක් විඳින්නට බවය.

**අචරිත්වා බ්‍රහ්මචරියං**

**අලද්ධා යොබ්බනෙ ධනං**

**ජිණ්ණකොඤ්චාව ඣායන්ති**

**ඛීණමච්චේව පල්ලලේ**[20]

යොවුන් වියේදී ධනය ඉපදවීම කළයුතුය. ඒ සඳහා බුදුදහමින් නිර්දේශිත දනෝපායන ක්‍රම අනුගමනය කළ යුතුය. එසේ නොකලේ නම් වයසට ගියපසු පසුතැවිලි වන්නට සිදුවන්නේ මසුන් නැති දිය සිඳුණු විලක මඩපිට හිඳ තැවෙන මහලු කොස්වාලිහිණියන් මෙන්ය. Max Webber සහ Heinz Beschert යන සමාජ විද්‍යාඥයන් විසින් බුදුසමය සමාජ ප්‍රගතියට හා ආර්ථික කටයුතුවලට බාධාවක් යැයි කියන්නේ බුදුසමයේ සඳහන් කරුණු කාරණා පිළිබඳ ව මුහුකුරා ගිය බුද්ධියකින් නොව තැනින් තැන දැනගත් කරුණුවල වාච්‍යාර්ථ අනුව යමිනි.[21] බුදුසමය මහත් සේ ධනය රැස්කිරීම හා ආර්ථික අත්පත් කර ගැනීම් පිළිබඳ ව අඩු උනන්දුවක් දක්වන්නේ යැයි ඔවුන් විසින් සඳහන් කරන්නනේ ජීවිතේ යථාර්ථය පිළිබඳ ව බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ඇතැම් කරුණු ගැන පමණක් සැලකිල්ලට ගනිමිනි. නිදසුනක් ලෙස පහත සඳහන් ගාථාව දැක්විය හැකිය.

**පුත්තාමත්ථි ධනම්මත්ථි - ඉති බාලො විහඤ්ඤති**

**අත්තාහි අත්තනො නත්ථි - කුතො පුත්තා කුතො ධනං**[22]

මෙහි ඇත්තේ බෞද්ධයාට පමණක් සාධාරණ වු කරුණු නොව සමස්ත ලෝකවාසීන්ට ම සාධාරණ වූ ධර්මතාවකි. එහෙත් තමා සම්බන්ධ සියල්ල තමාට අහිමි වෙනවාය යන දුකෙන් යුතුව කල කිරුණු සහ අපේක්ෂා භංගත්වයෙන් යුත් ජීවිතයක් බෞද්ධයා විසින් ගෙවිය යුතුය යන අදහසක් එහි නැත.

භික්ෂූන් වහන්සේලා ගිහි ජනතාවගෙන් යැපී ඇතැම් පිරිසකගේ විවේචනවලට පාත්‍ර වී ඇත. කසීභාරද්වාජ බ්‍රාහ්මණයා නිවන් දැකීමට හේතු සම්පත් ඇති බව වටහාගත් බුදුරජාණන් වහ්නසේ ඔහු සී සාන තැනට වැඩියහ. එහෙත් එය වරදවා වටහාගත් බමුණා බුදුරජාණන් වහන්සේට දෝෂාරෝපනය කලේ ඔහු මෙන් සී සා කුඹුරු වපුරා ආහාර ගන්නා ලෙයසි. **''අහංපි බො සමණ කසාමි ච වපාමි ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජාමි. ත්වම්පි සමණ කසස්සු ච වපස්සු ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජස්සූති''**[23] බුදුරජාණන් වහන්සේ ද එසේ කරමින් ආහාරගන්නා බවත්, හීයට අවශ්‍ය නගුල්, වියගස් ආදියත් පිළිබඳ ව බමුණාට පැහැදිලි කර දෙමින් තමාගේ හීය පිළිබඳ ව හා කෘෂි ආම්පන් පිළිබඳ ව මනා විස්තරයක් මෙසේ වදාළහ.

**සද්ධා බීජං තපො වුට්ඨී - පඤ්ඤා මෙ යුගනංගලං**

**හිරි ඊසා මනො යොත්තං - සති මෙ පාලපාචනං**

**කාය ගුත්තො වචී ගුත්තො - ආහාරෙ උදරෙ යතො**

**සච්චං කරොමි නිද්දානං - සොරච්චං මෙ පමෝචනං**

**විරියං මෙ දුර ධොරය්හං - යොගක්ඛෙමාධිවාහනං**

**ගච්ඡති අනිවත්තංතං - යත්ථ ගන්ත්වා න සොචති**

**ඔවමෙසා කසී කට්ඨා - සා හොති අමත්පඵලා**

**ඕතං කසිං කසිත්වාන - සබ්බ දුක්ඛා පමුච්චති**[24]

තමහිදී බුදුරජාණන් වහන්සේ කසීභාරද්වාජ බමුණාගේ ආර්ථික වටිනාකම් මෙන් ම බුදුන් වහ්නසේගේ ආධ්‍යාත්මික වටිනාකම් ද පෙන්වා දී ඇත. භික්‍ෂුව ධනධාන්‍ය වශයෙන් ගැනෙන උපභෝග පරිභෝග ත්‍ස්තු රැස් නොකරන අතර, එසේ වස්තු රැස් කරමින් ගිහි ජීවිතයක් ගත කරන ගිහි සමාජයට ආධ්‍යාත්මික වශයෙන් උසස් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය මග පෙන්වා දෙයි.පැවිදි සමාජයේ පෝෂණය, බර දැරීම සිදුවන්නේ ගිහියන් අතිනි. ගිහි පැවිදි සබඳතාවයෙහි පැහැදිලි මූලික යුතුකම් ගොඩ නැගෙන්නේ මෙම ආර්ථික උපකාරය පිලිබඳ ප්‍රති උපකාර සම්බන්ධ වූ කෘතඥතා පූර්වක වූ හැඟීම් මතය. නිතර තමන්ට උපකාර කරන ගිහියන්ට ධර්ම දානයෙන් ප්‍රත්‍යුපකාර කරන්නැයි සඳහන් වී ඇත්තේ එහෙයිනි.

**ගිහීනං උපකරොන්තානං - නිච්චමාමිස දානතො**

**කරොථ ධම්මදානෙන - තේසං පච්චුපකාරකං**[25]

මේ ගිහි පැවිදි සමාජ දෙකේම පැවැත්ම සාපෙක්‍ෂ වෙයි. ගිහි සමාජය සදාචාර සම්පන්නව ආර්ථික සංවර්ධනයක් ඇති කර ගත් විට භික්‍ෂුවගේ පැවැත්මට අවශ්‍ය සිව් පසය ද ඉන් ලැබෙයි. ගිහි සමාජය ආර්ථික වශයෙන් දුර්වල වූ විට භිජසුවගේ පැවැත්මට ද එය ඍජුව බලපායි. භික්‍ෂුව ආරණ්‍යයෙහි විසුවත් පිඬු පිණිස ගමට පැමිණිය යුතුය. එහෙත් මල නොතලා පැණි බොන බමරෙකු සේ පැවිද්දා විසින් ආහාර සපයා ගත යුතුය.

**යථාපි භමරෝ පුප්ඵං - වණ්ණ ගනධං අහෙඨයං**

**පලෙති රසමාදාය - එවං ගාමෙ මුනී චරෙ**[26]

භික්‍ෂුව සමාජයෙන් ඉවත් ව හුදකලාව තමාගේ විමුක්තිය ගැන පමණක් හිතන, සමාජ සම්බන්ධතාවතාවක් නැති පුද්ගලයෙකු සේ සිතන ඇතැම් පුද්ගලයෝ ද සිටිති. එහෙත් තමාට වඩා ගුණ නුවණින් උසස් කෙනෙකු හෝ තම තත්වයේ කෙනෙකු හෝ කල්‍යාණ මිතුරෙකු වශයෙන් ඇසුරු කිරීමට නැතිනම් හුදකලාව විසීම යහපත් බව ද බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළහ.

**චරං චෙ නාධිගච්ඡෙය්‍ය - සෙය්‍යං සදිසමත්තනො**

**එකචරියං දළ්හං කයිරා - නත්ථි බාලෙ සහායතා**[27]

යනුවෙන් දක්වන්නේ එයයි. සදාචාරාත්මක හා ආධ්‍යාත්මික දියුණුවක් උදෙසා සමාජය පමණක් නොව තම වස්තුව, පවුල ආදි සියල්ල අතහැර ගිහි ගෙයින් නික්මීම පිළිබඳ බොහෝ නිදසුන් බෞද්ධ ඉතිහාසයෙන් සොයාගත හැකිය. රට්ඨපාල තරුණයා ද ධනවත් පවුලකින් අවුත් පැවිදි වූවෙකි. භික්‍ෂුවක් වූ පසු භික්‍ෂුවට අයත් වන සතර නිස්සයට **(චත්තාරො නිස්සයා - පිණ්ඩියාලොපභොජනං නිස්සාය**

**පබ්බජ්ජා, පංසුකූල චීවරං නිස්සාය පබ්බජ්ජා, රුක්ඛමූල සේනාසනං නිස්සාය පබ්බජ්ජා, පූතිමුත්ත භේසජ්ජං නිස්සාය පබ්බජ්ජා)**[28] අනුව ජීවත් විය යුතුය. ආහාර සඳහා සිඟා යා යුතුය. අප්පිච්ඡතා, සන්තුට්ඨිකතා, සුභරතා වැනි ගුණාංගයන් භික්ෂු ජීවිතයේ ස්වභාවය හා දාර්ශනික සංකල්පයයි.

ඉහතින් සඳහන් කරන්නට යෙදුනේ බුදුදහම තුළ ආධ්‍යාත්මික සංවර්ධනයට හේතුවනකාරණා පිළිබඳ ව සඳහන් සූත්‍ර කිහිපයක් තොරතුරු පමණි. බුදු දහම නිතර ම ආධ්‍යාත්මික දියුණුවක් අපෙක්ෂාවෙන් කරුණු ඉදිරිපත් කරයි. එම ආධ්‍යාත්මික දියුණුව තුළින් මිනිසාට සමාජමය වශයෙන් පැන නැගී ඇති බොහෝ ප්‍රශ්නවලට පිළිතුරු සපයා දී ඇත.ඒ අනුව ආධායත්මික වශයෙන් මිනිසා දියුණු වන විට බාහිර වහයෙන් පවත්නා දිළිඳුකම ආදි සමාජ ප්‍රශ්න නිරායාසයෙන් ම මගහැරී යනු ඇත. එහිදී ලෝකයෙහි  ඇති වස්තූන්ගේ සීමාසහිත බව දැන පුද්ගල සිත තෘප්තිමත් කරගත යුතු අතර, ආධ්‍යාත්මික දියුණුව ද අපේක්ෂා කළ යුතුය. එමනිසා ලෝකයෙහි පවතින කවර සමාජයක වුව ද දිළිඳු බව නැතිකිරීමට උත්සහවත් ව, ක්‍රියාශීලීව කටයුතු කිරීම පුද්ගලාබද්ධ ක්‍රියාවලියක් වන අතර ඒ සඳහා රාජ්‍ය අංශයේ මනා මග පෙන්වීම, පරිසර හිතකාමී සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම වැනි කරුණු කෙරෙහි නැඹුරුතාවක් තිබියයුතු බව බුදු දහම් පෙන්වා දෙයි.

ආන්තික සටහන්

[1] පඤ්චතන්ත්‍රය, ලබ්ධප්‍රණාස, පළමු කථාව.
[2] අංගුත්තර නිකාය, ඡක්ක නිපාතො, ධම්මික වග්ගය, ඉණ සුත්තං, 118 පිට
[3] අංගුත්තර නිකාය, තික නිපාතො, ලොණඵල වග්ගය, 447 පිට
[4] අංගුත්තර නිකාය, තික නිපාතො, පුග්ගල වග්ගො, 238 පිට.
[5] අංගුත්තර නිකාය, චතුක්ක නිපාතො, පත්තකම්ම සුත්තං, 128 පිට.
[6] සංයුත්ත නිකාය, සළායතන වග්ග, ගාමණිසංයුත්ත, රාසිය සුත්තං,  පිට
[7] දීඝනිකාය, පාථිකවග්ග, චක්කවත්තිසීහනාද සුත්තං, 110 පිට.
[8] දීඝනිකාය, පාථිකවග්ග, චක්කවත්තිසීහනාද සුත්තං, 112 පිට.
[9] දීඝනිකාය, සීලක්ඛන්ධවග්ග, කූටදන්ත සුත්තං, 262 පිට
[10] දීඝනිකාය, පාථිකවග්ග, සිගාලොවාද සුත්තං, 296 පිට.
[11] අංගුත්තර නිකාය, අට්ඨක නිපාතො, ව්‍යග්ඝපජ්ජ සුත්තං, 236 පිට.
[12] අංගුත්තර නිකාය, චතුක්ක නිපාතො, පත්තකම්ම සුත්තං, 128 පිට.
[13] අංගුත්තර නිකාය, අට්ඨක නිපාතො, ව්‍යග්ඝපජ්ජ සුත්තං, 236 පිට.
[14] හෙට්ටිආරච්චි, ධනසේන, මුල් බුදුසමයෙන් හෙළිවන බෞද්ධ ආර්ථික දර්ශනය, 203 පිට.
[15] අංගුත්තර නිකාය, පඤ්චක නිපාතො, මුණ්ඩරාජවග්ග, පඤ්චභොග ආදිය සුත්තං, 70 පිට
[16] අංගුත්තර නිකාය, චතුක්කනිපාත, මහාවග්ග, මල්ලිකාදෙවී සුත්තං, 388 පිට.
[17] සංයුත්ත නිකාය, සගාථවග්ග පාළි, යක්ඛ සංයුත්තය, ආලවක සුත්තං, 382 පිට

[18] සංයුත්ත නිකාය, සගාථවග්ග පාළි, යක්ඛ සංයුත්තය, ආලවක සුත්තං, 382 පිට
[19] දීඝනිකාය, පාථිකවග්ග, සිගාලොවාද සුත්තං, 296 පිට.
[20] ඛුද්දක නිකාය. ධම්මපද පාළි, ජරාවග්ගෝ, ගා. 10, 64 පිට.
[21] Max Webber & Heinz Beschert, Buddhism and Society, pp. 36
[22] ඛුද්දක නිකාය. ධම්මපද පාළි, බාලවග්ගෝ, ගා. 03, 38 පිට
[23] සුත්තනිපාතො, කසීභාරද්වාජ සුත්තං, 24 පිට.
[24] සුත්තනිපාතො, කසීභාරද්වාජ සුත්තං, 24 පිට.
[25] මධුරත්ථ විලාසිනී නාම බුද්ධවංසට්ඨකථා, නිදානවණ්ණනා, හේ. වි. මු. 17 පිට.
[26] ඛුද්දක නිකාය. ධම්මපද පාළි, පුප්ඵ වග්ගෝ, ගා. 06, 36 පිට.
[27] ඛුද්දක නිකාය. ධම්මපද පාළි, බාලවග්ගෝ, ගා. 02, 38 පිට.
[28] මහාවග්ග පාළි, මහාක්ඛන්ධකං, 238 පිට.

ත්‍රිපිටක ග්‍රන්ථ සියල්ලක් ම පරිශීලනය කරන ලද්දේ බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණයයි.

අනුරාධපුර බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයේ
භාෂා අධ්‍යයන අංශයේ ආධුනික කථිකාචාර්ය
රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති වැලිවිට සොරත හිමි